# ලක්බිමේ මව්වරු සහ දියණියෝ
## இலங்கையின் அன்னையரும் புதல்வியரும்
## Mothers and Daughters of Lanka

Tel & fax : 94-11-2690192 174, Alwis Avenue, Castle Street, Colombo 8, Sri Lanka.


2007 ජූලි 11 දින,

ගරු මහින්ද රාජපක්ෂ මහතා
ජනාධිපතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

ගරු ජනාධිපතිතුමනි,

නැවතත් ශ්‍රී ලාංකිකයෙක් වූ යොවුන් කාන්තාවක් සෞදි ආරබියේ දී මරණ දණ්ඩනයට නියම වී ඇත. නෆීක් රිසාන් වන ඇය සිව් මසැති දරුවෙකු ගෙල සිර කොට මරා දැමීමේ වරදට හසුව ඇත.

1988 පෙබරවාරි 4 දින උපන් නසීක් රිසානා ජීවත්ව ඇත්තේ යුද්ධයෙන් පීඩිත වූ දුගී ගම්මානයක ය. බොහෝ දුගී පවුලක් වූ නිසාම ඇගේ දෙමාපියන් ඇයව මැද පෙරදිග සේවයට යවා ඇත. පුවත්පත් වාර්තාවලට අනුව ඇය ශ්‍රී ලංකාවෙන් පිටත්ව ඇත්තේ අවුරුදු 17 ක තරම් අඩු වයස්කාර ළමයෙකුව සිටිය දී ය. අප රටේ ළමුන් කෙරාටික විදේශ සේවා ඒජන්තවරුන් හසුවීමෙන් නොයෙක් දුෂ්කරතාවලට මුහුණපෑම ඉතා අවාසනාවන්ත සිද්ධියකි.

තවද පුවත්පත් වල පලවූ තොරතුරු අනුව නසීක් රිසානාගේ සිද්ධියේ දී ඇයගේ උපන් දිනය මෙම රැකියා ඒජන්තවරු විසින් වෙනස්කොට ඇති අතර ඇයගේ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් වන්නේ ඇය 1982 පෙබරවාරි 2 වැනි දා උපත ලැබූ බවයි. රැකියා ඒජන්තවරු ඇයට සෞදි අරාබියේ රැකියාවක් ලබාදීමට මූලික වශයෙන් බලපා ඇත්තේ රිසානාගේ වෙනස් කළ උපන් දිනය වන අතර 2005 මැයි මස දී ඇය මැද පෙරදිගට පිටත්ව ඇත.

ඉතා ලාබාල වයසේ පසු වූ ඇයට ඇයගේ සේවාදායකයෝ ඔවුන්ගේ ළදරුවාට ආහාර දීමට, කිරි පෙවීමට පවරා ඇත. ඇයට කුඩා දරුවන්ට ආහාර දීම පිළිබඳව කිසිදු අත්දැකීමක් නොමැති බව පැහැදිලි කරුණකි. වාර්තා වී ඇති අන්දමට ළදරුවා මියගොස් ඇත්තේ කිරි උගුරේ හිර වීමෙනි.

මෙම තත්ත්වය වරදවා වටහා ගත් සේවාදායකයෝ මෙම ලාබාල යුවතියට රළු ලෙස සලකමින් ගෙල සිරකොට දරුවා මැරීම සම්බන්ධයෙන් ඇයව පොලීසියට බාර දී ඇත. වාර්තා වී ඇති අන්දමට පොලිස් ස්ථානයේ දී රිසානට පරුෂ ලෙස සලකා තිබේ. පසුගිය සිද්ධීන්වල දී මෙන්ම මෙම ලාබාල තැනැත්තියට සිදුවූයේ කුමක්දැයි විස්තර කිරීමට පරිවර්තකයෙක් හෝ වෙනත් කිසිදු උපකාරයක් ලැබී නොමැත. එමෙන්ම පාපොච්චාරණය පහදා ඇගෙන් බලෙන්ම අත්සන් ගෙන ඇති අතර පසුව උසාවියේ දී ගෙල මිරිකා මිනිමැරීම සම්බන්ධයෙන් වරදකරු කොට ඇත.

වාර්තාවලට අනුව නඩුව ඇසූ විනිශ්චයකාරවරුන් මිය ගිය ළදරුවාගේ පියාගෙන් තම බලය භාවිතා කොට මෙම යුවතියට සමාව දෙන මෙන් ඉල්ලා ඇත. නමුත්, එම පියා එවැනි සමාව දීමක් ප්‍රතික්ෂේප කොට ඇත. මෙම සාධකය පදනම් කොටගෙන උසාවිය රිසානා ගෙල සිඳ මරා දැමීමේ මරණ දඬුවමට යටත් කොට ඇත. මෙම දඬුවම පනවන ලද්දේ 2007 ජූනි 16 වැනිදාය.

ඉහත දඬුවමට එරෙහිව ආයාචනයක් ඉදිරිපත් කිරීමට මසක කාලයක් ලැබී ඇත. අද ඔබගෙන් අප ආයාචනා කොට සිටින්නේ මෙම සම්බන්ධයෙන් හැකි පමණ ඉක්මනින් ඉදිරිපත් වී ඇය වෙනුවෙන් සමාවක් ලබාදෙන ලෙසයි. එයට හේතුව සත්‍ය වශයෙන්ම

සිදුව ඇත්තේ ඛේදජනක සිදුවීමක් මිස සිතා මතා කළ ගෙල මිරිකා මිනී මැරීමක් නොවන බැවිනි.

ගල්ෆ් කලාපයේ රටවල් සමඟ ඔබට ඇති කිට්ටු සහ මිත්‍රශීලී සබඳතාව අපි හොඳාකාරව දනිමු. කඩිනමින් මැදිහත් වී නෆීක් රිසානාගේ ජීවිතය ගලවා දෙන ලෙස අපි ඔබෙන් නැවතත් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

මෙයට,
විශ්වාසී,

**සංවිධානය**

ලක්බිමේ මව්වරු සහ දියණියෝ
ශ්‍රී ලංකා රාජ්‍ය නොවන කාන්තා සංවිධාන එකතුව
සංක්‍රමණික සේවකයින් සඳහා වන ක්‍රියාකාරී ජාලය
කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
සමාජ විද්‍යාඥයින්ගේ සංගමය
ඉමාඩා ආයතනය
ඉන්ෆෝම් ආයතනය
ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය
ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් සුරැකීමේ ව්‍යාපාරය
ඩාබිඳු සාමූහිකය
ස්ත්‍රී මධ්‍යස්ථානය, ඒකල
කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානය
ඌව වෙල්ලස්ස ගොවි කාන්තා සංවිධානය
දිරියකත සංවිධානය
දේවසරණ සංවර්ධන කේන්ද්‍රය
විකල්පනී කේන්ද්‍රය
බින්තැන්න ගැමි කාන්තා පෙරමුණ
කාන්තා සංවර්ධන පදනම, කුරුණෑගල
කාන්තා සංවර්ධන පදනම, බදුල්ල
පහළ ඌව මානව හිමිකම් සංවිධානය
මහාචාර්ය නෙලුෆර් ද මෙල්
අයිරාංගනී සේරසිංහ
සීතා රංජනී
මැණිකා වැන්ඩපුටන්

පිටපත් :- 1. ගරු අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා,
*විදේශ කටයුතු ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය*

2. ඉන්ද්‍රාණි සුගතදාස මිය,
*ප්‍රධාන ලේකම්තුමිය - ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය*

2007 ජූලි 12 දින,

....................................

....................................

....................................

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,

**<u>මාධ්‍ය ආවරණයක් ලබාගැනීම සඳහා</u>**

මේ සමඟ එවනු ලබන ලියවිල්ල අප සංවිධානය විසින් සකස් කරනු ලැබූ අතර එය ඔබ පුවත්පතේ/මාධ්‍ය වැඩසටහනේ පළ කරන/ප්‍රචාරය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි,

මෙයට,
විශ්වාසී,

වයලා පෙරේරා